**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**

**பொலிஸ் ஊடகப் பிரிவு**

**POLICE MEDIA DIVISION**

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2026.03.06 පැය 1230 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 395/2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**සංවිධානාත්මක අපරාධකරුවෙකු විසින් මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගන්නා ලද මුදලින් මිලදීගෙන ඇතැයි සැලකෙන රුපියල් කෝටි 02 ක් පමණ වටිනාකමින් යුත් දේපල ක්‍රියා විරහිත කිරීම - නීති විරෝධි වත්කම් විමර්ශන කොට්ඨාසය.**

පොලිස්පතිතුමාට ලද තොරතුරකට අනුව පානදුර ප්‍රදේශයේ පදිංචිව සිටි දැනට විදේශගතව සැඟව සිටින සංවිධානාත්මක අපරාධකරුවෙකු විසින් මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගන්නා ලද මුදලින් ඔහුගේ සහෝදරයාගේ නමින් මිලදී ගෙන ඇති බවට සැලකෙන දේපලක් සම්බන්ධයෙන් නීති විරෝධී වත්කම් විමර්ශන කොට්ඨාසය මඟින් විමර්ශන ආරම්භ කරන ලදි.

සිදුකරන ලද විමර්ශනයේදී මෙම සංවිධානාත්මක අපරාධකරු විසින් මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගන්නා ලද මුදලින් මිලදී ගෙන ඇතැයි සැලකෙන මහබෙල්ලන, අළුබෝමුල්ල ප්‍රදේශයේ පිහිටි රුපියල් කෝටි 02 ක් පමණ වටිනා පර්චස් 21 ක් පමණ වන නිවසක් සහිත ඉඩමක්, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත ප්‍රකාරව 2026.03.06 දින සිට දින 07ක කාලයක් සඳහා ක්‍රියා විරහිත කිරීමේ නියෝගයක් ලබා ගැනීමට කටයුතු කර ඇත.

නීති විරෝධි වත්කම් විමර්ශන කොට්ඨාසය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**